සන්නස

Sannasa
244 Princes Hwy
Hallam Vic 3803 Australia
Web: www.sannasa.net
www.sannasa.com
email :sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241after 4pm

**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සංස්කරණ උපදේශක / Editorial Advisor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රචා / Graphics**
ශානලී එදිරිසිංහ Shanalee Edirisinghe

**වෙළඳ දැන්වීම් / Advertising**

**S Jayasinghe**
03 8707 4604
0402 025 516
email- sjturaus@optusnet.com.au

**Kuma Gamage**
0414 215 280
email- ads.sannasa@gmail.com

**Account Details for Payments**

| | |
|---|---|
| **Account Name** | **- Sannasa Media** |
| Bank | - Westpac |
| BSB Number | - 033 341 |
| Account Number | - 590847 |

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වී ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ
මහින්ද දිසානායක දිවුල්ගනේ

**ඡේයා රූ / Photography**
Prasanna Kurukularatna

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku

**QLD**
Ananada Samaratunga
2, Santorini Pl.
Forest Lake
QLD 4078
(07) 3372 7958

**WA**
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhdist Vihara

**ACT**
Asoka Nimalasiri
0400 429 031

**SA**
Chandra Eeriyagama
08 8331 2318

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත





සැබෑ මිනිසා වාසිය රැඳී ඇති මාවත් නොසොයයි
ඔහු සොයන්නේ යුක්තිය රැඳී ඇති මාවතයි
ජෝසේ මාටි

## ලියා දන්වන වගයි

## මේ වෙනසකට වේලාවයි

බලයට ඇති ආදරය, ආදරයට ඇති බලය විසින් යටපත් කරනු ලැබූ දිනෙක ලෝකයට සාමය උදා වනු ඇතැයි මහත්මා ගාන්ධි තුමා වරක් ප්‍රකාශ කළේය.

අද ශ්‍රී ලංකාවේ අපි නිරීක්ෂණය කරමින් සිටින්නේ බලයට ඇති අසීමිත ආදරය සහ කෑදරකම වෙනුවෙන් සියලු යහපත් දේ යටපත් කරදමමින් දුවන වියරු දිවිල්ලකි. අද පාලකයන් පැහැදිලිවම පෙන්වන්නේ මහජනයාට ඇති ආදරය නොව බලයට ඇති ආදරයයි.

සමස්ථ සමාජයම සකළ විධ දූෂණයේ කලු වළාවෙන් වැසී යමින් තිබියදී බලයට ඇති අසීමිත කෑදරකම නිසාවෙන් නීතිය යුක්තිය තඹයකට මායිම් නොකරමින් මේ යමින් සිටින ගමනේ අවසානය සුබවාදී එකක් නොවන බව නම් පැහැදිළිය.

මත් ද්‍රව්‍ය දුරාචාරය අසාධාරණය රාජ්‍ය අනුග්‍රහයෙන් රජ කරන රටක නීතියත් වල් වැදුන විට සිදුවිය හැක්කේ කුමක්ද යන්න අමුතුවෙන් පැහැදිළි කළ යුතු නැත.

රටේ පාලනය කෙතරම් පිරී ඇත්දැයි පෙන්වා දෙන්නට එකම එක සිදුවීම පමණක් වුව සෑහෙයි. මහා පරිමාණයෙන් කුඩු ගෙන්වන්නේ යයි සැක කළ මීගමුව ප්‍රදේශයේ දේශපාලකයකුගේ නිවසකින් කුඩු අල්ලා ගන්නට පොලිස් මත්ද්‍රව්‍ය නාශක අංශය සමත් විය. රටේ පාලකයා ඒ ආරංචිය ලද සැණින් හෙළිකොප්ටරයකින් මීගමුවට ගොස් අදාල දේශපාලකයාගේ නිවසට ගොඩ වී ඔහු බදා වැළඳ ගත්තේ පොලිසියට අනතුරු ඇඟවීමක් ලෙසින් නොවේද? ඒ අනතුරු ඇඟවීම තේරුම් ගත් පොලීසිය සියල්ල යට ගසා නිහඬ වීම පුදුමයක් නොවේ. මිනීමැරුම් චෝදනා ලද්දවුන්ට සැලියුට් ගහන තරමට පොලීසිය පහතට දමා ඇති රටකට වෙනසක් අවශ්‍ය නොවේද? අප පෙළ





ගැසිය යුත්තේ ඒ වෙනස වෙනුවෙන් නොවේද?

තනි මිනිසකුගේ බල උමතුව වෙනුවට යහපත් පාලනයක් වෙනුවෙන් බලා සිටින ජනතාවට අස්වැසිල්ලක් ලැබිය යුතුය.

මහින්ද රාජපක්ෂ ජනාධිපතිධුරයට තරග කරන විට ඔහු වෙනුවෙන් ප්‍රසිද්ධියේ පෙනී සිටි ඕස්ට්‍රේලියාවේ එකම මාධ්‍යය සන්නස යි. අපේද සභයෙන් පත් වූ නායකයා නොමග ගොස් සිටින විට ඒ බව ප්‍රසිද්ධියේ කතා කළ එකම මාධ්‍යයද සන්නස යි. එසේ වූ අපි අද රටට වෙසක් අවශ්‍ය බව කියන්නටද නොපැකිළෙන්නෙමු.

ජනාධිපති වියරුව අවසන් කර යහපත් රටක් ගොඩනැගීම වෙනුවෙන් පෙළ ගැසෙන ලෙස අපි ඉල්ලා සිටිමු. ඒ අපේ යුතුකමයි. අද ඒ යුතුකම ඉටු නොකළහොත් තවත් දවසක් එන්නේ නැති බවද ලියා තබන්නට කැමැත්තෙමු.

සංස්කාරක

# කෲර ඒකාධිපති පාලනය අතුගා දමන්නට එක්වන්න

## හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග



### චන්ද්‍රිකා චෝදනා වලට පිළිතුරු දෙයි

**ශ්‍රී ලංකාවේ තෙවන විධායක ජනාධිපතිවරිය වූ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග ජනාධිපති ධුරයෙන් සමුගැනීමෙන් පසු දේශපාලන පරිසරයෙන් දුරස්ව වසර දහයකට ආසන්න කාලයක් නිහඬව හුදකලාව පසුවිය. හදිසියේම ඉකුත් සතියේ ඇය නැවත ප්‍රසිද්ධ දේශපාලන වේදිකාවේ දක්නට ලැබුණේ ජනාධිපතිවරණයේදී විපක්ෂයේ පොදු අපේක්ෂකයා ලෙස මෛත්‍රීපාල සිරිසේන ඉදිරිපත්වන බව නිවේදනය කෙරුණු අවස්ථාවේදීය. පොදු අපේක්ෂකයා හඳුන්වා දෙමින් එදින ජනතාව ඇමතූ ඈ මේ වන විට විපක්ෂයේ පොදු අපේක්ෂකයා ජයග්‍රහණය කරවීම සඳහා පැවැත්වෙන රැස්වීම් ආමන්ත්‍රණය කරමින් සිටින්නීය. ඒ සමග නැවතත් ඇය දේශපාලන ක්ෂේත්‍රයේ නිතර කතාබහට ලක්වන චරිතයක් බවට පත් විය. සිය වත්මන් දේශපාලන භූමිකාව පිළිබඳ ඇය සන්නස හා සාකච්ඡාවකට එක්වූයේ මෙලෙසිනි.**

**ඔබ පසුගිය කාලයේ බොහොම නිහඬවයි හිටියේ. ඇයි මේ විදිහට නැවතත් දේශපාලන වේදිකාවට ගොඩවෙන්න තීරණය කළේ?**

ඔව් මම අවුරුදු නවයක් තිස්සේ නිහඬව හිටියා. අඩු තරමේ මාධ්‍යයටවත් කතා කළේ නෑ. හැම මාසයකම වගේ මාධ්‍ය ආයතන විස්සකින් විසිපහකින් විමසීම් එනවා ඉන්ටවිව්ස් ඉල්ලලා. ඒ කිසිවකටවත් මම කතා කළේ නෑ. මගේ කිසිම කැමැත්තක් තිබුණේ නෑ මේ පිළිකුල් දේශපාලනයට ආයෙත් එකතුවෙන්න. ඊත් දවසෙන් දවස රට විනාශයට පත්වෙන ආකාරය දකින කොට තවදුරටත් නිහඬව සිටීම මගෙන් රටට සිදුවිය යුතු යුතුකම් පැහැර හැරීමක් කියා හිතුණා. ඒ නිසයි නැවතත් දේශපාලන වේදිකාවට නැග්ගේ. තවත් ටික කාලයක් මේ පාලනය තිබුණොත් අපේ දරුවන්ටවත් රටක් ඉතිරි වෙන්නේ නෑ.

**මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාට තුන්වෙනි වරටත් ජනාධිපතිවරණයක් සඳහා ඉදිරිපත් විය හැකි බවට ශ්‍රේෂ්ඨාධිකරණය මතයක් පලකොට තිබෙනවා. ඒ අනුව ඔබටත් නැවත ජනාධිපති ධුරය සඳහා තරග කිරීමට හැකි බවයි නීතිවේදීන් කියන්නේ. ඒ අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්න ඔබ සූදානම්ද?**

කොහෙත්ම නෑ. මට බලයට ඒ වගේ පෙරේත කමක් නෑ. බණ්ඩාරනායක ප්‍රතිපත්තිවල හරය මගේ තියන නිසා. නමුත් මේ පවතින ක්‍රමය වෙනස් කරලා රටේ අනාගතය යහපත් කරන්න මට පුළුවන් හැම සහයෝගයක්ම මම දෙනවා.

**ඔබ මේ උත්සාහ දරන්නේ ඔබගේ පුතා දේශපාලනයට ගෙන එන්න කියලා ඇතැම් අය කියනවා.**

මම කවදාවත් මගේ දරුවන් දේශපාලනයට ගෙන එන්නේ නෑ. මට වගේම මගේ

6 වන පිටට